ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

**පෙරහැර අංකය :- ……………………**

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**51 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2025 – 2025 නොවැම්බර් 19**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි සඳහා පවත්වන උපාධි ප්‍රදානෝත්සවය 2025 නොවැම්බර් 19 දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.**

මෙම උපාධි ප්‍රදානෝත්සවය සැසි **02** කින් යුක්ත වන අතර ඔබට නියමිත සැසිය පහත දැක්වේ.

දසවන සැසිය - **2025 නොවැම්බර් මස 19 වැනි දින පෙ.ව. 08.00 සිට පෙ.ව. 10.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රය**

- කළමනාකරණ විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, ව්‍යාපාර ආර්ථික විද්‍යා විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, දේපළ කලමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, ව්‍යවසායකත්වව්‍යාධිපති, රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරන විද්‍යාපති, රාජ්‍ය කළමනාකරණපති, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති,වෘත්තිය ගිණුම්කරණපති, ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දේපල කලමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රයට අදාළ පශ්චාද් උපාධිලාභීන් සඳහා

එකොලොස්වන සැසිය - **2025 නොවැම්බර් මස 19 වැනි දින පෙ.ව. 11.00 සිට ප.ව. 01.00 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ**

- දර්ශනසූරි, දර්ශනපති, ශාස්ත්‍රපති, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, කළමනාකරණ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, දත්ත විද්‍යාව හා කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති, දේපල කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති, භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණ පිළිබඳ විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාපති, අපරාධ යුක්තිය හා විශෝධනය පශ්චාද් උපාධිය, කාර්මික කාබනික රසායන විද්‍යාව පශ්චාද් උපාධිය, පරිගණක විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති, ව්‍යවසායකත්වපති, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, වෘත්තිය ගිණුම්කරණ පශ්චාද් උපාධිය, සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය, අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය,

ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, බහුඅවයවික විද්‍යාව තාක්ෂණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය, ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය සහ සමාජ සංඛ්‍යානය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රයට අදාළ පශ්චාද් උපාධිලාභීන්

සැ.යු.:- ඔබ වෙත පිරිනමනු ලබන උපාධි සහතිකයට, උප්පැන්න සහතිකයට අනුව ඔබගේ නම සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් ඇතුලත් කරනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ලියාපදිංචි ලේඛනයන්හි හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවෙන් අනුමත අවසන් ප්‍රතිඵල ලේඛනයන්හි සඳහන් ආකාරයට බැවින් කිසිඳු ආකාරයක වෙනසක් සිදු නොකරන බව අවධාරණයෙන් යුතුව දන්වා සිටිමි.

## 1. <u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>

- <u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රයට අදාළ පශ්චාද් උපාධිලාභීන් සඳහා</u>

  - **2025 නොවැම්බර් 15, 16 සහ 17 යන දිනයන්හි පෙ.ව.09.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා සහ ප.ව.01.00 සිට ප.ව. 04.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රයේ දී උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ ප්‍රවේශපත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.**

  - උපාධි ලෝගුව සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත / මාර්ගගත ගෙවුම් ලදුපත) සහ ශිෂ්‍ය හැඳුනුම්පත කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රය වෙත <u>භාර දිය යුතුය.</u>

- <u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට අදාළ පශ්චාද් උපාධිලාභීන් සඳහා</u>

  - **2025 නොවැම්බර් 15, 16 සහ 17 යන දිනයන්හි පෙ.ව.09.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා සහ ප.ව.01.00 සිට ප.ව. 04.00 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දී උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම සහ ප්‍රවේශපත්‍ර ඔබ වෙත නිකුත් කරනු ලැබේ.**

  - උපාධි ලෝගුව සහ හිස්වැස්ම සමඟ උපාධි ප්‍රදානෝත්සවයට අදාළ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා රු.5,000/= තැන්පතු මුදල ගෙවන ලද අදාළ කුවිතාන්සිය (බැංකු රිසිට්පත / මාර්ගගත ගෙවුම් ලදුපත) සහ ශිෂ්‍ය වාර්තා පොත පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. <u>ශිෂ්‍ය හැඳුනුම්පත මෙතෙක් භාරදී නොමැති නම් එය මෙම අවස්ථාවෙ දී පීඨ කාර්යාලයට භාර දිය යුතුය.</u>

එලෙසම උපාධි ලෝගුව සහ හිස්වැස්ම භාවිතා කිරීම සඳහා වන ආචාරධර්ම උපාධිලාභියා විසින් අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු වන අතර, එම ආචාරධර්ම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ පල කරනු ලැබේ. එය කියවා හොඳින් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

තවද, කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුළ උපාධි ලෝගු හා හිස්වැසුම් නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව, හිස්වැස්ම නොමැතිව කිසිඳු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබා ගත හැකිය.

**2. <u>උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම ආපසු බාරදීම:</u>**

- **<u>කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රයට අදාළ පශ්චාද් උපාධිලාභීන් සඳහා</u>**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු එදිනම භාර දිය හැකිය. යම් හෙයකින් එලෙස භාරදිය නොහැකි වුවහොත් **2025 නොවැම්බර් 29 වන දිනට පෙර කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාද් උපාධි කේන්ද්‍රය වෙත පැමිණ** උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම භාර දිය හැකි අතර නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම භාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු එදිනම භාරදෙන අවස්ථාවේ දී ඒ සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට කටයුතු කරන අතර එදිනට පසුව භාර දෙන උපාධි ලෝගු සහ හිස්වැසුම් සඳහා එම මුදල ඔබගේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව සහ හිස්වැස්මට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

- **<u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට අදාළ පශ්චාද් උපාධිලාභීන්</u>**

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරය වෙත භාර දිය හැකිය. යම් හෙයකින් එලෙස භාරදිය නොහැකි වුවහොත් **2025 නොවැම්බර් 29** වන දිනට **පෙර පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට පැමිණ** උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම භාර දිය හැකි අතර නියමිත දිනට පෙර උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම භාරදීමට අපොහොසත් වුවහොත් ප්‍රමාද වන දින අනුව දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

උපාධි ලෝගුව සමඟ හිස්වැස්ම භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සහ හිස්වැස්ම සඳහා ගෙවන ලද රු. 5000/= ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව ඔබ වෙත ලබා දුන් උපාධි ලෝගුව, හිස්වැස්මට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී ඇත්නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

**3. <u>ඇඳුම්:</u>**

කාන්තා උපාධිලාභීන් අභිමත වර්ණයක <u>සාරි හෝ ඔසරිවලින්</u> අනිවාර්යෙන්ම සැරසී සිටිය යුතු අතර පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

**4. <u>පැමිණීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ වීමට <u>පැය එක හමාරකට පෙර</u> බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ උපාධිලාභී පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

**5. <u>උපාධි පෙරහැරේ පෙළ ගැසීම:</u>**

ගිහි පැවිදි සියලුම උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුතු අතර, ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳ සිටීම අනිවාර්ය වේ. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති පෙරහැර අංකයේ පිළිවෙලට පෙළ ගැසිය යුතුය.

6. **<u>පෙරහැර අංකය පැළඳ සිටීම:</u>**

ඔබගේ උපාධි සහතිකය වෙනත් උපාධිලාභියකු වෙත නිකුත් වීම වැලැක්වීම සඳහා ඔබගේ පෙරහැර අංකය උපාධි ලෝගුවේ අලවනු ලැබේ. ඔබ ප්‍රධාන වේදිකාවට ප්‍රවිශ්ඨ වන අවස්ථාවේ දී එම පෙරහැර අංකය උපාධි ලෝගුවෙන් නොගැලවෙන සේ තබා ගැනීමට ඔබ විසින් වගබලා ගත යුතුය.

7. **<u>වේදිකාව තුල දී උපාධි සහතිකය ලබා ගැනීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව, උපාධිලාභීන්ගේ නම් ප්‍රකාශ වන අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය ප්‍රදානය කරනු ලැබේ.

8. **<u>ප්‍රවේශ පත්‍ර:</u>**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පියන් හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගුව සහ හිස්වැස්ම සමඟ නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, වාහන ප්‍රවේශ පත්‍රය ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු <u>18 ට</u> අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

9. **<u>උපාධි පිරිනැමීම නිමාව:</u>**

එක් සැසියක් අවසානයේ සංග්‍රහයක් පැවැත්වෙන අතර, ඊට අදාළ අවසර පත්‍ර ඔබගේ ප්‍රවේශ පත්‍රය සමඟ ඇත. ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභීන්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට කටයුතු කරනු ලබන බැවින්, ඒ සඳහා බාධාවක් නොවන පරිදි ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී ඔබගේ සහයෝගය දක්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

10. **<u>ඡායාරූප ලබා ගැනීම</u>**

ඡායාරූප ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල ඡායාරූප ආයතනයක් තෝරා ගනු ලැබේ. විශ්වවිද්‍යාල නිල ලාංඡනය සහිතව ඡායාරූප නිකුත් කළ හැකි වනුයේ එම ආයතනයට පමණි. විශ්වවිද්‍යාලය මගින් අනුමත ඡායාරූපවල ප්‍රමාණයන් හා මිල ගණන් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් පසුව දැනුවත් කරනු ලැබේ. ඡායාරූප ලබා ගැනීම සඳහා අදාළ ආයතනය වෙත මුදල් ගෙවීම උපාධි ප්‍රදානෝත්සව දිනයේදී සිදු කල හැකිය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග අංශය
ලේඛකාධිකාරී වෙනුවට

**සැලකිය යුතුයි.**

- **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතූන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වැළකිය යුතුය.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA**

**Procession Number:-............................**

**Reverent Monk**

**Dear Sir/Madam/Miss**

## 51st Convocation 2025 – 19th November 2025

The Postgraduate Sessions of 51st Convocation of the University of Sri Jayewardenepura will be held on **19th November 2025** at the **Bandaranaike Memorial International Conference Hall (BMICH) , Baudhaloka Mawatha, Colombo 07.**

This Convocation will consists of **two sessions**, and the session allocated to you is indicated below.

**10th Session -** **On 19th November 2025, from 8.00 a.m. to 10.00 a.m.**
**Faculty of Management Studies and Commerce - Postgraduate Center for Business Studies**

Graduate of the following postgraduate degrees and postgraduate diplomas are expected to attend this Session :

- **Master of Science in Management, Master of Business Administration, Master of Science in Business Economics, Master of Scinece in Applied Finance, Master of Science in Real Estate Management and Valuation, Master's in Entrepreneurship, Master of Science in Public Policy and Management, Master of Public Management, Master of Bussiness Economics, Master of Professional Accounting, Postgraduate Diploma in Entrepreneurial Business Management, Postgraduate Diploma in Real Estate Management and Valuation and Postgraduate Diploma in Management.**

**11th Session -** **On 19th November 2025, 11.00 a.m. to 01.00 p.m.**
**Faculty of Graduate Studies**

Graduate of the following postgraduate degrees and postgraduate diplomas are expected to attend this Session :

- **Doctor of Philosophy, Master of Philosophy, Master of Arts, MSc in Food Science and Technology, MSc in Management, MSc in Industrial Analytical Chemistry, MSc in Data Science and Artificial Inteligence, MA in Teaching English as a Second Language, MSc in Real Estate Management and Valuation, MSc in Compute Science, MSc in Polymer Scince and Technology,**

**MSc in GIS and Remote Sensing, MSc in Forestry and Environmental Management, MSc in Applied Finance, MSc in Applied Statistics, Master of Criminal Justice and Corrections, Master of Industrial Organic Chemisry, Master of Computer Science, Master of Business Adminisatration, Master of Entrepreneurship, Master of Business Economics, Master of Professional Accounting, Master of Sociology, Postgraduate Diploma in Monitoring and Evaluation, Postgrtaduate Diploma in Criminology and Criminal Justice, Postgraduate Diploma in Food Science and Technlogy, Postgraduate Diploma in Management, Postgraduate Diploma in Industrial Analytical Chemistry, Postgraduate Diploma in Teaching English as a Second Language, Postgraduate Diploma in Polymer Science and Technology, Postgraduate Diploma in Fisheries and Aquatic Resources Management, Postgraduate Diploma in Applied Finance, Postgraduate Diploma in Applied Statistics and Postgraduate Diploma in Social Statistics.**

N.B:- The name printed on your degree certificate will strictly follow the spelling and format appearing in your birth certificate and as recorded in the university registration documents and final results approved by the University Council. No alterations will be permitted under any circumastances.

## 1. Issuance of Cloaks and Passes:

➢ **For the Graduands of the Faculty of Management Studies and Commerce, Postgraduate Center for Business Studies**

Cloaks, Hats and Passes will be issued on **15th , 16th , and 17th November 2025** at the Postgraduate Center for Business Studies Faculty of Management Studies and Commerce, from **9.00 a.m.to 12.00 noon and 1.00 p.m. to 4.00 p.m.**

- To collect the cloak,hat and convocation passes, you must submit the deposit slip of **Rs.5000 /=** (Bank receipt/online payment slip) along with your **student identity card** to the Postgraduate Center for Business Studies, Faculty of Management Studies and Commerce.

➢ **For the Graduands of the Faculty of Graduate Studies**

Cloaks, Hats and Passes will be issued on **15th , 16th , and 17th November 2025** at the Faculty of Graduate Studies from **9.00 a.m.to 12.00 noon and 1.00 p.m. to 4.00 p.m.**

- To collect the cloak,hat and convocation passes, you must submit the deposit slip of **Rs.5000 /=** (Bank receipt/online payment slip) along with your **student record book** to the faculty office.
- If your student identitiy card has not yet been returned, it must also be handed over at this time.

You are strictly required to follow the etiquette for the use of the cloak and hat, which will be published on the University website.

Please not that cloaks and hats will not be issued on the day of the Convocation. Attendance without the cloak and hat will not be permitted. for monks, the vijinipatha will be issued at BMICH on the same day.

2. **Return of Cloaks and Hats :**

- **For the Graduands of the Faculty of Management Studies and Commerce, Postgraduate Center for Business Studies**

Cloaks and hats may be returned to the special counter at BMICH on the day of the Convocation. If unable to do so, they must be returned to the Postgraduate Center for Business Studies, Faculty of Management Studies and Commerce on or before 29th November 2025.

- Failure to return the cloak and hat on time will result in a penalty fee.
- The refundable deposit of Rs. 5,000 /= will be returned in cash to those who are returning the cloak and hat on the convocation day.
- The refundable deposit of Rs. 5,000 /= will be credited to your bank account upon returning the cloak and hat to those who are returning the cloak and hat after the convocation date.
- If the cloak / hat is damaged or misplaced , you will be required to pay the full replacement cost.

- **For the Graduands of the Faculty of Graduate Studies**

Cloaks and hats may be returned to the special counter at BMICH on the day of the Convocation. If unable to do so, they must be returned to the Faculty of Graduate Studies on or before 29th November 2025.

- Failure to return the cloak and hat on time will result in a penalty fee.
- The refundable deposit of Rs. 5,000 /= will be returned in cash or credited to your account upon returning the cloak and hat.
- If the cloak / hat is damaged or misplaced , you will be required to pay the full replacement cost.

3. **Dress Code :**

- Female graduands : Saree / Osariya of a suitable colour.
- Male graduands : National dress or Western attire with a necktie.

4. **Arrival :**

You must arrive at BMICH at least 1½ hours before the commencement of the session and be ready to join the procession.

5. **Graduation Procession :**

All graduands, both lay and monk, must participate in the procession. Lay graduands must wear the cloak and hat. You must line up in the order of your procession number as per the official list provided.

6. **Procession Number :**

To prevent errors in certificate distribution, your procession number will be attached to your cloak and must remain intact until you collect your degree certificate on stage.

7. **Awarding of Degree Certificates**:

During the ceremony,graduands will be called to the stage in order, and your degree will be conferred by the Chancellor or Vice – Chancellor of the University of Sri Jayewardenepura.

8. **Passes:**

Entry to BMICH is permitted only on presentation of issued passes. Each graduands will receive:

- One convocation pass for self.
- Two guests convocation passes and
- One vehicle pass (issued together with the cloak and hat.)

No person under **18 years of age** will be permitted inside the hall.

9. **Conclusion of Session:**

At the end of each session, refreshment will be served and token for the refreshment is provided with your convocation pass.All graduands and guests are kindly requested to leave the hall and procession areas promptly, to facilate arrangments for the next session.

10. **Photography:**

The University has appointed an official photographer. Only this photographer is authorized to issue photographs with the University logo. Details of photograph sizes and prices will be announced later via the University website. Payments for the convocation photographs should be made on the convocation date.

Senior Assistant Registrar
Academic Student Affairs, Publications and Examinations Division
For Registrar

Important:

- For security reasons,cameras and mobile phones are **strictly prohibited inside BMICH.** Please refrain from bringing them.